# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 420/25 — 1986 සැප්තැම්බර් 26 වැනි සිකුරාද — 1986.09.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—බී. 21/78

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 (1) වන වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, ජූනියස් රිචර්ඩ් ජයවර්ධන වන මම, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24 වන වගන්තිය යටතේ සාදනු ලැබ 1981 මැයි මස 21 වන දින අංක 141/5 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, 1986 ඔක්තෝබර් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි මේ නියමයෙන් ප්‍රත්‍යාදිෂ්ට කරමි.

ජේ. ආර්. ජයවර්ධන,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

1986 සැප්තැම්බර් මස 25 වන දින,
කොළඹ දී ය.

10-258/1

---

ඇල්. ඩී.—බී. 21/78

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, ජූනියස් රිචර්ඩ් ජයවර්ධන වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමයෙන් 1986 ඔක්තෝබර් 1 වන දින සිට—

(i) විද්‍යාව, කෘෂිවිද්‍යාව, වාණිජ්‍යය හා කළමනාකරණය සහ සංස්කෘතික අධ්‍යයනය යන අධ්‍යයන ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය ලබාදීමේ, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු, විශ්වවිද්‍යාලයක් පිහිටුවමි.

(ii) ඒ විශ්වවිද්‍යාලයට "ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය" යන නාමය සහ අභිධානය දෙමි.

(iii) ඒ විශ්වවිද්‍යාලයේ මූලස්ථානය පිහිටා තිබිය යුතු ස්ථානය මඩකලපුව දිස්ත්‍රික්කයේ මඩකලපුව ලෙස නියම කරමි.

(iv) ඒ විශ්වවිද්‍යාලයට විද්‍යාව, කෘෂිවිද්‍යාව, වාණිජ්‍යය හා කළමනාකරණය සහ සංස්කෘතික අධ්‍යයන පීඨ පවරමි.

(v) මෙහි පහත 1 වන තීරයේ සඳහන් ඒ විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨය, මෙහි පහත 2 වන තීරයේ ඊට අනුරූප සටහනෙහි සඳහන් අධ්‍යයන අංශ වලින් සමන්විත විය යුතු යයි නියම කොට දක්වමි.

| 1 වන තීරය | | 2 වන තීරය |
|---|---|---|
| විද්‍යා පීඨය | ... | උද්භිද විද්‍යා අධ්‍යයන අංශය |
| | | රසායන විද්‍යා අධ්‍යයන අංශය |
| | | ගණිත අධ්‍යයන අංශය |
| | | සත්ව විද්‍යා අධ්‍යයන අංශය |
| | | භූගෝල විද්‍යා අධ්‍යයන අංශය |
| | | භෞතික විද්‍යා අධ්‍යයන අංශය |
| කෘෂි විද්‍යා පීඨය | ... | ශස්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | | කෘෂි-ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය |
| | | පශු විද්‍යා අධ්‍යයන අංශය |
| වාණිජ්‍ය විද්‍යා හා කළමනාකරණ පීඨය | ... | වාණිජ විද්‍යා අධ්‍යයන අංශය |
| | | ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය |
| | | කළමණාකරණ අධ්‍යයන අංශය |
| සංස්කෘතික අධ්‍යයන පීඨය | ... | අරාබි භාෂා අධ්‍යයන අංශය |
| | | ඉස්ලාමීය අධ්‍යයන අංශය |
| | | ලලිත කලා අධ්‍යයන අංශය |

ජේ. ආර්. ජයවර්ධන,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

1986 සැප්තැම්බර් මස 25 වන දින,
කොළඹ දී ය.

10-258/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.